# බෞද්ධ දේශපාලන ආචාර ධර්ම

# Buddhist Political Ethics

මාකඳුරේ සාන්තභද්‍ර හිමි

**Abstract**

Buddhist political ethics promote governance based on compassion, wisdom, and non-harming, guided by principles like generosity, honesty, and non-violence. Leaders are encouraged to prioritize the welfare of all citizens, fostering a just and harmonious society through ethical restraint and mindfulness. This approach balances economic development with social and environmental responsibility, suggesting that true leadership comes from moral integrity and selflessness.

**Keywords:** Buddhist, political, ethics, society

**හැඳින්වීම**

පාලකයා හෝ පාලක පිරිස විසින් අනුගමනය කරනු ලබන විවිධ ප්‍රතිපත්ති දේශපාලන ආචාර ධර්ම වේ. ආචාර ධර්ම හැඳින්වීමට ඉංග්‍රීසි භාෂාව තුළ ETHICS යන වචනය භාවිතා කෙරේ. ලතින් භාෂාවෙන් එය ETHICUS යනුවෙන්ද හැඳින්වේ. එහෙයින් අර්ථගන්වන්නේ 'චරිතය' යන්නයි. පුද්ගලයකු හෝ සමූහයක් ආචාර ධර්ම පුරුද්දෙන් හෝ චාරිත්‍රානුකූලව කරන කාර්යක් නොවන අතර යමක් කිරීමට බුද්ධිමත්ව කල්පනා කිරීම මත රඳා පවතින්නකි. පී.ඒ මුවර් මහතා ආචාර ධර්ම අර්ථගන්වනු ලබන්නේ ''චරිතයේ යහපත අයහපත නොව, ප්‍රධාන වශයෙන් යහපත යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද? යන්න පිළිබඳව පමණක් කරන විමර්ශනය හා සම්බන්ධ විෂයක්'' ලෙසයි. තව

දුරටත් ආචාර ධර්ම පිළිබඳ අර්ථකථන ඉදිරිපත් කරන ජෝන් එස්. මැකන්සි සඳහන් කරනු ලබන්නේ ''ආචාර ධර්ම වනාහි හැසිරීමේ අඩංගු පරමාදර්ශය, යුක්තිය හෝ අයුක්තිය, යහපත හෝ අයහපත පිළිබඳ සිද්ධාන්තමය අධ්‍යයනයය'' යන්නයි. රාජ්‍ය පාලනයේ දී පාලකයා විසින් ඇතිකර ගත යුතු ආචාර ධර්ම මොනවාද යන්න හා එහි පරමාර්ථය කුමක් ද යන්න අප ගවේෂණය කළ යුතු ප්‍රධාන අවශ්‍යතාවයකි. හොඳ නරක කවර අංශයක් වුවද ජනතාව මෙහයවීමේ ශක්තිය පාලකයා සතු වේ. නෛතික වශයෙන් යම් ආකල්පයක් රට වැසියා තුළ ඇතිකිරීමට නායකයට හැකිවන අතර නායකයා අනුගමනය කිරීමට පෙළඹීමෙන්ද ජනතාව වෙනස් කළ හැකිය. පාලිතයා පාලකයාගේ හැසිරීම් රටාව (චරණය) අනුගමනය කිරීමෙන් එම රාජ්‍යයේ යහපත අයහපත හා දියුණුව හා අපගමණය තහවුරුකර ගත හැක. මෙයින් වඩාත් ගම්‍ය වන්නේ රටක නායකත්වය මනා චරිතවක් භාවයකින් යුක්ත විය යුතු බවයි. දේශපාලන ඉගැන්වීම් තුළ පාලකයාගේ පමණක් නොව පාලිතයාගේ දායකත්වය අවධාරණය කරන බුදු දහම යහපත් ප්‍රතිපත්ති රාජ්‍ය පාලනයට පෙන්වාදී තිබේ. දීඝනිකායේ චක්කවත්ති සීහනාද, කූටදන්ත, සිගාලෝවාද, මහා පරිනිබ්බාන සූත්‍ර ඊට නිදසුන් වේ. ප්‍රජාතාන්ත්‍රිය ලක්‍ෂණ දරන්නාවූ සමාජයේ සියලු දෙනාගේ සුබසිද්ධිය, රක්‍ෂණය හා පෝෂණය ඇතුලු පාලිත වෙනස් අයිතිවාසිකම් නොලැබෙන්නේනම් තම තමාට ගැලපෙන රාජ්‍ය පාලනයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම බුදු දහම තුළ සඳහන් වේ. මානව අයිතිවාසිකම් රකිමින් රාජ්‍ය පාලනය කිරීම, රටේ අපරාධ මර්දනය කිරීම, රටේ ආර්ථික විෂමතා නැති කිරීම, ධාර්මික ප්‍රතිපත්තිවලින් රට පාලනය කිරීම බෞද්ධ දේශපාලන ආචාර ධර්ම තුළ රජුට පවරා දී ඇති වගකීම වේ.

**සාකච්ඡාව**

පාලකයකු පත්කරගැනීම පිළිබඳ මූලික තොරතුරක් හමුවන්නේ දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය තුළින්ය. එම සූත්‍රයට අනුව පාලකයකු පත්කර ගැනීම මුළින්ම සිදුවූයේ පෞද්ගලික

දේපල ආරක්ෂා කර ගැනීම සඳහාය. මහජන සම්මුතියෙන් පාලකයකු පත්කර ගැනීම තුළින් අපේක්ෂිත අරමුණ වූයේ සාමකාමී දැහැමි සමාජයක් ගොඩ නගා ගැනීම හා සමාව දිය හැකි දෙයට සමාව දිය හැකි, ගැරහිය යුතු දෙයට ගරහන්නා වූ ද, ඉවත්කළ යුතු දේ ඉවත් කළ හැකි පුද්ගලයකු තුළින් සමාජ පාරිශුද්ධියයි. මහජනතාවගේ සම්මුතියෙන් නායකයා පත්කර ගත් නිසා ඔහුට 'මහාසම්මත' යැයි නම තැබූ අතර ඔහු කෙත්වතු ආදියට අධිපති වූ බැවින් 'ඛත්තිය' නම් වන බවත් ධර්මානුකූලව රාජ්‍ය පාලනයට පොරොන්දු දුන් බැවින් 'රාජා' යනුවෙන්ද හැඳින්වෙන බව අග්ගඤ්ඤ සූත්‍රය තුළ දැක්වේ. මහාසම්මතයෙන් පත්කර ගත් පාලකයා රටේ එක් පිරිසකට පමණක් පාලකයා නොවන අතර ඔහු සමස්ත ජනතාවගේ පාලකයා වේ. පාලිතයාගේ සුබ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කරන විට එක් පිරිසකට පමණක් විශේෂ වරප්‍රසාද ලබා නොදිය යුතුය. රජු කුමන තාරතිරමක පුද්ගලයකු සමග වුවද කටයුතු කිරීමේදී අගතිගාමී නොවී ක්‍රියා කළ යුතු ආකාරය බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. ඡන්ද, දොස, භය, මොහ යන සතර අගතියට පාලකයකු පත්වුව හොත් ඔහු තුළින් දැහැමි සාමාජයක් නිර්මාණය කිරීම අපේක්ෂා කළ නොහැක. පාලකයා සියලු කටයුතු තුළදී ධර්ම නැමැති රාමුව තුළ කටයුතු කළ යුතුය.

පාලකයකු සතු උසස් ගුණාංග පිළිබඳ අවධාරණය කරන බුදු දහම පාලකයා සතර සංග්‍රහ වස්තුවලින් සමන්විත විය යුතු බව දක්වා ඇත. දානය, ප්‍රියවචන, අර්ථ චර්යාව, සමානාත්මතාව එම උසස් ගුණ ධර්ම වේ. සංග්‍රහ වස්තුව ගමන් කරන රථයක කඩ ඇණයට උපමා කිරීමෙන් සමාජයේ පැවැත්මට ඒවායේ අවශ්‍යතාව මැනවින් හෙළිකරයි. සමාජයක පවතින ප්‍රබල සබඳතාව මව හා පුතු අතර පවතින සම්බන්ධයයි. එසේම පාලකයා පාලිත පිරිස කෙරෙහි සතර සංග්‍රයෙන් සත්කාර කරන්නේනම් මව හා පුතු අතර පවත්නා සබඳතාව මෙන් එම රාජ්‍යය බැබළීමට පත්වේ. දානය යනු දීමයි. රාජ්‍ය නායකයා ජනයාගේ දිළිඳු කම පිටු දැකීමට දායානුග්‍රහයෙන් පිරිනමන වස්තුව දානයයි. එපමණක් නොව අනුන්ගේ යහපත සඳහා කාලය, ධනය, ශ්‍රමය, බුද්ධිය කැපකිරීමද දානය වේ. මේ සියලු පරිත්‍යාගයන් ජනතාවගේ

සුබ සිද්ධිය වෙනුවෙන් කැපකිරීම පාලකයා සතු වගකීමකි. සතර සංග්‍රහ වස්තුවේ දානය යටතේ අපේක්ෂිත අරමුණ වන්නේ සමාජමය අර්ථයයි. පරාර්ථකාමී හැඟීමෙන් රටවැසියාගේ යහපත වෙනුවෙන් කැපවීම පාලකයාගෙන් මහජනයා අපේක්ෂිත අරමුණ වේ. පාලන ක්ෂේත්‍රය තුළ දානය භාවිතා කළ යුතු ආකාරය කූටදන්ත, චක්කවත්ති සීහනාද ආදී සූත්‍ර තුළ සඳහන් වේ. ආර්ථික විෂමතා හමුවේ ජනතාව සොර මැරකම් කරන කල්හි දඬුවම් දීමෙන් අපචාර නවතාගත හැකි නොවේ. ඊට පිළියම් සේවීම වස් පාලකයා විසින් කෘෂිකාර්මික හා ව්‍යාපාරයන්හි යෙදීමට කැමැති පුද්ගලයන්ට අවශ්‍ය මූල්‍ය ධනය සපයා දිය යුතුය. මෙම සුබ සාධන ක්‍රියා පටිපාටිය තුළින් රට යහපත් වනු නොවනු මානය. එහෙත් ධනය බෙදා දීමේදී පාලකයා වඩාත් සැලකිළිමත් විය යුතු බව චක්කවත්ති සීහනාද සූත්‍රය මගින් බුදුන් වහන්සේ පෙන්වා දී තිබේ. ඒ තුළින් පෙන්වා දෙනු ලබන්නේ ආර්ථිකය මුල්කොට ගෙන ගැටුම් ඇතිවන කල ඔවුන්ට ධනය ලබා දෙනු ලැබුවත් ධනය නිසි පරිදි ආයෝජනය නොකොට ඔවුහු නැවත සොරකමේ යෙදෙන බවත්ය. රජතුමා නැවැතත් සොරුන් සඳහා ධනය ලබා දුනි. එම පුවත අසා වැඩි පිරිසක් ධනය ලැබීමේ අපේක්ෂාවෙන් සොරකමට පෙළඹුණාහ. ධනය බෙදා දීම යහපත් පාලකයකු උත්තුංග අභිලාෂයක් වුවද සතර අගතියෙන් තොරව පාලකයා මූලය ආධාරය අවශ්‍යම පුද්ගලයා තෝරාගෙන ලබා දිය යුතුය.

සතර සංග්‍රහ වස්තුවේ දෙවැන්න වනුයේ 'පෙය්‍යවජ්ජ' හෙවත් ප්‍රිය වචනයයි. පාලකයා කණට අමිහිරි වචන තෙපළීමෙන් වැලකී කණට ප්‍රිය වචන තෙපළීමෙන් රාජ්‍ය පාලනයේ උසස් අරමුණු සඳහා ජනතාව මෙහය වීමට අවකාශය ලැබේ. සාර්ථක පාලනයක් සඳහා අත්තුක්කංසන හා පරවම්භන වචන ඉවත්කළ යුතුය. කුලය, ධනය, බලය, හා නිලය නිසා පාලකයාගේ වචන අධාර්මික වූ විට රාජ්‍යයේ නිෂ්පාදනය හා සේවකයන්ගේ අවංකත්වය බිඳ වැටේ. පාලකයා චතුර්විධ වාග් දුෂ්චරිතයෙන් ඉවත්වී දැහැමි කථාවේ යෙදීම තුළින් යහපත් දේශපාලන වාතාවරණයක් ගොඩනගා ගත හැකිය.

සතර සංග්‍රහ වස්තුවේ තෙවැන්නෙන් අදහස් කරනුයේ අර්ථචර්යාවය. රටවැසියාගේ ආධ්‍යාත්මික හා බාහිර අභිවෘද්ධිය වෙනුවෙන් පාලකයා ක්‍රියා කළ යුතුය. ''චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්‍ථාය හිතායසුඛාය'' (මහාවග්ගපාළි I.2005, 19-20) ඒ තුළින් බුදුන් වහන්සේ 'අත්‍ථ' යන වචනයෙන් අර්ථගන්වනු ලැබුවේ දෙව් මිනිසුන්ගේ ආධ්‍යාත්මික හා සදාචාරාත්මක අර්ථය වේ. පාලකයා සමාජයේ වෙසෙන අනෙක් පුද්ගලයන්ගේ දියුණුව උදෙසා ක්‍රියා කරන්නේ නම් එය අර්ථචර්යාව වේ. පාලකයා අනර්ථචරියාව පිණිස යොමුවීමෙන් සමාජය පමණක් නොව එසේ යොමු වූ පුද්ගලයා පවා පරිහානියට පත්වේ. එහෙයින් පාලකයා හෝ පාලක පිරිස සියලු දෙනාට යහපතක් හා සාධාරණයක් ඉටුකරමින් ජීවත්වීම අර්ථචර්යාව ලෙස හඳුනාගත හැකිය.

සිව්වන සංග්‍රහ වස්තුව සමානාත්මතාවය. ඉන් පැහැදිලි වන්නේ අනුන් තමා හා සමකොට සිතා ක්‍රියා කිරීමයි. සමානාත්මතාවයෙන් ක්‍රියා කරන පාලකයා කුලවාද බැහැරකොට සැමදෙනා සමග සමසිතින් ක්‍රියා කරයි. ඒ තුළ උස් පහත් භේද නොමැත. සංයුත්ත නිකායේ වෙළුද්වාර සූත්‍රයේ ද සඳහන් වන්නේ එම සමානාත්තතා මූල ධර්මයයි. ''යො ඛො ම්‍යයං ධම්මො අප්පියෝ අමනාපො පරස්සපොසො ධම්මො අප්පියො අමනාපො, යො ඛො ම්‍යයං ධම්මා අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයෝජෙය්‍යන්ති? සො ඉති පටිසංඛාය අත්තනාච පාණාතිපාතා පටිවිරතො හොති පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, වෙරමණියා වණ්ණභාසති'' ආත්මාර්ථ හා පරාර්ථ දෙක එකිනෙකට ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකක් ලෙස මෙහි අර්ථ ගැන්වේ. කෙනෙක් තවකෙකුගේ දුක දැක තමාත් ඒ දුක්ඛිතයාගේ තත්ත්වයට ආරෝපණය වී ක්‍රියා කිරීම මෙහෙදී සිදු වේ. ඒ කරුණාව වේ. තවකෙකුගේ සැපය දැක එය තමාට ලැබුණා සේ සතුටුවීම මුදිතාව වේ. තමා හා මිත්‍රත්වයෙන් සළකනු ලබන්නේ නම් ඒ මෛත්‍රිය වේ. පාලකයා අටලෝ දහමින් කම්පා නොවී ක්‍රියා කිරීම ද සමානාත්මතාවයේ එක් පැතිකඩකි. රාජ්‍ය පාලකයා නිතර විවිධ ගැටලු, ප්‍රශ්නවලට මුහුණ දෙයි. එම ප්‍රශ්ණ

ගැටලු සඳහා මුහුණ දීමේ දී කම්පා නොවී ඊට ශක්තිමත්ව මුහුණ දීමට පාලකයාට යහපත් පෞරුෂයක් ගොඩනගා ගත යුතුය. ලාභ, යස, ප්‍රශංසා හා සැප හමුවේ පාලකයා මානයෙන් උමතු නොවී මැදහත් සිතින් ඉවසිය යුතුය. එමෙන්ම අලාභ, අයස, නින්දා හා දුක් හමුවේ කම්පිත නොවී මැදහත් සිතින් ඉවසිය යුතුය. එලෙස අගතිගාමී නොවී ක්‍රියා කිරීම තුළින් පාලකයා අපෙක්ෂිත අරමුණ වූ දැහැමි සමාජයක් ගොඩනගා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

පරමාදර්ශී රාජ්‍ය පාලනයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම දස සක්විති වත් තුළින් බුදු දහම පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන් චක්කවත්තී සීහනාද, මහා සුදස්සන සූත්‍රයන්හි මේ සම්බන්ධයෙන් කරුණු ඇතුළත් වේ. එම සූත්‍රයට අනුව සක්විති රජු ධර්ම පහකින් යුක්ත විය යුතුය. එනම්

01. හොද නරක අවබෝධ කරගැනීමේ ශක්තිය (අත්ථ)

02. යුක්ති ධර්මයට යටත්ව රට පාලනය කිරීම (ධම්ම)

03. සමාජ ආර්ථික කටයුතුවලදි පමණ දැනීම (මත්ත)

04. කාලානුරූපව ක්‍රියා කිරීම (කාල)

05. ස්වකීය රටවැසියා සමග යහපත් සබඳතාවක් පවත්වා ගැනීම (පරිස) (අ.නි. III, 2005:243)

සක්විති ධර්ම ආරක්ෂා කරනු ලබන පාලකයා පංච ශීලයක පිහිටා කටයුතු කරන බව සඳහන් වේ. ඔහු සමස්ථ භූමියේම ආරක්ෂකයාද වේ. එම නිසා ඔහු සමස්ථ පරිසරයම ආරක්ෂා කළ යුතු වේ. ''රාජා චක්කවත්තී එවමාහ. පාණො න හන්තබ්බො, අදින්නං නාදාතබ්බං, කාමේසු මිච්ඡා නචරිතබ්බා, මුසාන භාසිතබ්බා, මජ්ජංන තබ්බං යථා භුත්තඤ්ච භුඤ්ජථාති'' (අ.නි. III, 2005)

චක්‍රවර්ති රජුගේ ප්‍රධාන වගකීම වන්නේ රටේ වෙසෙන ජනතාව හා සත්ත්ව ප්‍රජාවගේ ආරක්‍ෂාව තහවුරු කිරීමය. එම ආරක්‍ෂාව කොටස් තුනකින් යුක්ත විය යුතුය.

01. ධාර්මික වූ ආරක්‍ෂාව

02. දිළිඳුබවෙන් ආරක්‍ෂාව

03. සොර සතුරන්ගෙන් හා උපද්‍රවයන්ගෙන් ආරක්‍ෂාව

රටවැසියාගේ මූලික අවශ්‍යතා සපුරාලමින් ඔවුනට සුවපහසු ජීවිතයක් ගත කිරීමට ඉඩ සැලසීම ද උපද්‍රවයන්ගෙන් ආරක්‍ෂාකර ගැනීම ද සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීම පාලකයා සතු ප්‍රධාන වගකීම හා වගවීම වේ. අපරාධ හැකිතාක් දුරට අවම කරගෙන සාමකාමී සමාජයක් ගොඩ නැගීමට පාලකයා ක්‍රියා කළ යුතු බව සක්විතිවත් තුළින් දක්වයි. විශ්‍රාම යන සක්විති පාලකයකු තම පුත්‍රයාට දෙන අවවාදයෙන් එය වඩාත් පැහැදිලි වෙයි.

'' දයාබර පුත්‍රය, ධර්මය මත රඳා පවතිමින්, ධර්මයට ගරු කරමින්, ධර්මයට පුද සත්කාර කරමින්, ධර්මය ම තමාගේ උතුම් ස්ථානයේ තබා ගනිමින්, තමන් ම ධර්ම ධජයක්, ධර්ම සංකේතයක් බවට පත්වෙමින්, ධර්මය තමාගේ ගුරුතුමා වශයෙන් තබා ගනිමින් ඔබගේ සියලු ම ජනතාවට ද, ආරක්‍ෂක සේනාංක ද, උසස් අයට ද, පහත් අයට ද, බ්‍රාහ්මණයන්ට ද, ගෘහපතියන්ට ද, නගරයේ සහ ජනපද වැසියන්ට ද, ශ්‍රමණයන්ට ද, සතුන්ට ද, පක්ෂීන්ට ද, ඔබ විසින් ම නියම ආරක්‍ෂාව ද, මනාව රැකබලා ගැනීම ද සැලසිය යුතුය. ඔබගේ රාජ්‍යයේ දුප්පතකු සිටී නම් ඒ තැනැත්තාට ධනය දියු යුතුය.'' (දී.නි. චක්කවත්ති සීහනාද සුත්ත,2005: 110)

යහපත් පාලනයක් රටක පැවැත්වීම සඳහා පාලකයා විසින් පිළිපැදිය යුත කරුණු දහයක් ජාතක පාලියේ සඳහන් වේ. එනම්

01. දාන - දුගී දුප්පතුන් ඇතුළු සියලු රටවැසියාගේ යහපත පිණිස සුභ සාධක කටයුතු

02. සීල - දුෂ්චරිතයෙන් මිදී සංවරව වාසය කිරීම

03. පරිච්චාග - රට වැසියාගේ සුභ සිද්ධිය උදෙසා පාලකයාගේ කාලය, ධනය, ශ්‍රමය, බුද්ධිය විවේකය කැපකිරීම

04. අජ්ජව - අවංකව, ඍජුව ක්‍රියා කිරීම

05. මද්දව - මෘදු ගුණයෙන් ක්‍රියා කිරීම

06. තපස - චාම් සැහැල්ලු දිවියක් ගත කිරීම

07. අක්කෝධ - කෝප නොවී විසීම

08. අවිහිංසාව - සියලු දෙනාට නිදහස්ව ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම

09. ඛන්ති - ඉවසීම

10. අවිරෝධතා - මහජන මතයට කන් දී ක්‍රියා කිරීම

මෙම කරුණු දහය සමස්තයක් ලෙස ගත් විට රජවරුන් අනුගමනය කළ යුතු ව්‍යවස්ථානුකූල නීති මාලාවක් ලෙස ඇතැම් විචාරකයෝ සළකති. (දයා ප්‍රනාන්දු, 1984)

දස රාජ ධර්ම තුළ දානය යන්නෙන් අදහස් කරන්නේ අවිචාරවත් ලෙස ධනය බෙදා දීම හෝ නෑයින්ට හා හිතවතුන්ට ධනය හා රැකියා ආදිය ලබා දීම නොවේ. එමෙන්ම රජය සතු වත්කම් නිකරුණේ බෙදා දීමක් ද නොවේ. රටවැසියාගේ සුභ සිද්ධිය වෙනුවෙන් රැකියා ලබා දීම, අසරණ දිළින්දන් සඳහා ආහාර පාන හා ප්‍රත්‍යයන් සැපයීම, අසාධාරණ ධන ව්‍යාප්තියක් ඇතිනොවන පරිදි ආර්ථිකය සුරක්ෂිත කිරීම දසරාජ ධර්මයන්හි දානයේ අපේක්ෂිත අරමුණයි.

සීලය යන්නෙන් බුදු දහමේ සඳහන් වන්නේ කායික හා වාචසික සංවරයයි. කයින් සිදුවන අකුසල හා වචනයෙන්

සිදුවන අකුසල බුදු දහමෙහි සඳහන් වේ. එම අකුසල ධර්මයන් පාලකයකු සිදු කරන්නේ නම් එම රාජ්‍යය දිනෙන් දින පරිහානිය තෙක් ගමන් කරයි. රටක සාම්ප්‍රදායික ව පිළිගත් චාරිත්‍ර වාරිත්‍ර සමුදායක් ඇත. මේවා පිළිබඳව මනා අවබෝධයක් පාලකයා සතුව පැවැතිය යුතුය. ඒ තුළින් ඔහු තම රාජ්‍යය නව දිශාභිමුඛයට ගෙන යායුතුය.

පරිත්‍යාගය තුළින් ගම්‍ය වන්නේ පාලකයා තම රටවැසියා වෙනුවෙන් කාලය, ධනය, ශ්‍රමය, දැනුම, සැප පහසුව කැපකිරීමට සූදානම් බවය. පාලකයාට පෞද්ගලික අරමුණක් නොතිබිය යුතුය. පොදු අරමුණක් පෙරදැරිව ක්‍රියා කිරීම තුළින් දූෂණය හා වංචාව දුරු වේ. පොදු අරමුණක් නොමැතිව ක්‍රියා කළ ඇතැම් පාලකයන් නිසා රාජ්‍ය පරිහානියද සිදු විය. රට වැසියන්ගේ යහපත වෙනුවෙන් පාලකයා උපරිමයෙන් කැපවිය යුතුය. ඇතැම් පාලකයන් සතුරු ආක්‍රමණ හමුවේ තම ජීවිතය පරිත්‍යාග කරණු ලැබුවේ රට වැසියන්ගේ නිදහස වෙනුවෙනි.

පාලකයා එක දෙයක් පවසා වෙනත් දෙයක් කිරීමට පෙළඹෙන්නේ විවිධ පුද්ගලයන්ගේ බසට රැවටීම නිසාය. අගතිගාමී නොවී ඍජු තීරණ ගැනීමට පාලකයාට ශක්තියක් තිබිය යුතුය. නායකත්වයන් විනාශ වීමට හේතු වන්නේ පක්ෂපාතී වීම, ක්‍රෝධය, භය, හා මෝඩකම නිසාය. පාලකයා මෙම දුර්වලතාව මගහරවා ගෙන සබුද්ධිමත්ව ක්‍රියා කළ යුතු බව බුදු දහම පෙන්වා දෙයි. මෘදු ගතියෙන් අදහස් කරන්නේ සංවේදී බව හා නම්‍යශීලි ගතිය ය. පාලිත ජනතාව පීඩනයට පත් කරන දරදඬු නීති රීති හා දණ්ඩ ක්‍රම පාලකයා අනුගමනය නොකළ යුතුය. මෘදු ගතිය යනු පාලකයාගේ ස්ථිරසාර ගතිගුණවලින් තොරවීම නොවේ. නීති රීති නැති බවද නොවේ. නීති රීති හා දඬුවම් ක්‍රියාවට නැංවිය යුත්තේ ජනයා පෙළීමට නොව ජනයාගේ සුභ සිද්ධිය වෙනුවෙන්මය. ඒ තුළ පළිගැනීමේ චේතනාවක් නොමැතිවිය යුතුය.

තපස තුළින් පැහැදිළි වන්නේ පාලකයා අධික කාමභෝග යන්ට ගොදුරු නොවී අය වැය සමව පවත්වා ගනිමින් රටේ

අනාගත සුභ සිද්ධිය වෙනුවෙන් කැපවී ක්‍රියා කිරීමය. ඉන්ද්‍රියන් පිනවමින් කල් ගෙවීම තුළින් මහජන අප්‍රසාදයට පාලකයා පත් වේ. පාලකයා හා පාලිතයා අතර තිබිය යුත්තේ පිය පුතු සබඳතාවකි. පාලකයා රට වැසියන්ට ක්‍රෝධ නොකළ යුතුය. පාලකයා වෛරයෙන් ක්‍රියා කරන්නේ නම් එම රාජ්‍යයේ දියුණුවක් දැක ගත නොහැක. පාලකයා සෑම විටම හිංසනයෙන් තොරව ක්‍රියා කළ යුතුය. රට වැසියන්ට බදු බරින් හිර කිරීම හා ශ්‍රමය සූරා කෑම තුළින් එම රාජ්‍යයේ හෝ පාලකයාගේ දියුණුවක් සිදු නොවේ.

ඕනෑම රාජ්‍යයකම පන්ති ප්‍රාන්තර පවතී. ජනයාගේ රුචි අරුචි කම් අනුව විවිධ ගැටලු ඇතිවිය හැක. එම සෑම අවස්ථාවකදීම පාලකයා ඉවසීමෙන් ක්‍රියා කළ යුතුය. ඇතැම් විට පාලකයාගේ බසට ජනයා අවනත නොවන අවස්ථා මතවිය ද හැක. ඔවුන් කැරලි කෝලහාල හා උද්ඝෝෂණ ඇති කරමින් රාජ්‍ය දේපල විනාශ කිරීමට ද යොමුවිය හැකිය. එවිට පාලකයා ඉන් උරණ නොවී ඉවසීමෙන් ක්‍රියා කළ යුතුය. ඉවසීම නොමැතිවූ විට තම රාජ්‍යය මෙන්ම ජීවිතය ද ඔහුට අහිමිවිය හැක. පාලකයාගේ අභිලාෂය පරිදි රට වැසියන් එක රාමුවක් තුළ කොටුකළ නොහැක. ඔවුන්ගේ විවිධ අදහස් මතවාද නිසා පාලක විරෝධී ප්‍රතිපත්තිද අනුගමනය කරනු ඇත. පාලකයා මහජන මතයට සවන් යොමුකොට වඩාත් නිවරදි තීරණය සුපරීක්ෂාකාරීව ගත්විට දසරාජ ධර්ම තුළින් අපේක්ෂිත අරමුණ වූ දැහැමි පාලනයක් හා යහපත් සමාජයක් ගොඩ නැගීමට ඉඩ හසර ලැබේ.

බෞද්ධ දේශපාලන ආචාර ධර්ම යටතේ යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සප්ත අපරිහානි ධර්ම තුළින් පෙන්වා දෙයි. ලිච්ඡවි රාජ්‍යයේ ක්‍රියාත්මක වූ සප්ත අපරිහානීය ධර්ම බුදු වහන්සේගේ ද ඇගයුමට ලක්ව ඇත. අපරිහානි ධර්ම යම්තාක් දුරට වජ්ජීන් ආරක්ෂා කරයි ද එතෙක් ඔවුන්ගේ රාජ්‍යය නොපිරිහෙන බව බුදුන් වහන්සේ පෙන්වා දුන්හ. එම ධර්ම සත මෙසේය,

01. නිතර රැස්වීම

02. සමගිව රැස්ව,සමගිව විසිර යාම හා සමගියෙන් කාර්යයන් හි නිරත වීම

03. නොපැන වූ නීති නොපැන වීම, පැන වූ නීති නොකඩවා පවත්වාගෙන යාම

04. වැඩිමහල්ලන්ට සත්කාර, ගරුකාර කිරීම, මානනයෙහි පූජනයෙහි යෙදීම, ඔවුන්ගේ වචන ඇසිය යුතු කොට සිතීම.

05. කාන්තාවන්ට නිසි ගෞරවය ලබා දීම හා ආරක්ෂා කිරීම

06. රට තුළ හා පිටත ඇති පූජනීය ස්ථානවලට ගෞරවය දැක්වීම හා ඒවාට පරිත්‍යාග කිරීම.

07. ආගමික පූජ්‍ය පක්ෂයට රැකවරණය හා සුව පහසුව සැපයීම. (හෙට්ටිආරච්චි,2006)

වජ්ජීන්ගේ මෙම ප්‍රතිපත්ති තුළින් පැහැදිලි වන්නේ ඔවුන් කෙතරම් දුරට ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් අනුගමනය කරමින් පාලන කටයුතුවල නිරතව් සිටියේ ද යන්නයි. පාලකයා හා පාලිතයා අතර සමගි සම්පන්න බව විරල දර්ශනයකි. සමගියෙන් රැස්ව, සමගියෙන් විසිර යාම තුළින් පැහැදිලි වන්නේ එකමුතු බව මත රාජ්‍යයේ සමෘද්ධිය තීරණය වන බවය. රාජ්‍යය තුළ අධිකරණ බලය රජු සතු වේ. පාලකයාගේ නීති මාලාවට සෑම පුරවැසියෙකුම යටත්විය යුතුය. නව නීති පැනවීමට වඩා පැනවූ නීති ආරක්ෂා කිරීම තුළින් රාජ්‍යයක ආරක්ෂණ යාන්ත්‍රණය කෙලෙස පැවැතියේ ද? යන්න පැහැදිලිය. රාජ්‍යයේ අනාගතය තීරණය වන්නේ එරට වාසය කරන රට වැසියාගෙනි. එරට වැසියන් අතර ජ්‍යෙෂ්ඨයන්, කාන්තාවන් හා පූජක පක්ෂය වැදගත් වේ. ඔවුන්ට රක්ෂණය දීම හා සුදුසු කළ උපදෙස් ලබා ගැනීම තුළින් රාජ්‍යයේ ප්‍රතිපත්ති මාලාව වටහාගත හැක. මෙම පිළිවෙත්

අනුව රට පාලනය කරන්නා ජනරඤ්ජන රජකු බවට පත් වේ. රට වැසියන්ට ප්‍රිය කරන, ගරු කරන පාලකයකු බවට ද පත්වේ.

**සමාලෝචනය**

දේවවාදී අගම් තුළ රාජ්‍යත්වය දිව්‍යමය පහළවීමක් බව සඳහන් වේ. මනුස්මෘතියේ සඳහන් වන 'රජතුමා යනු මිනිස් වෙසින් පෙනී සිටින්නා වූ තෙදබල සම්පන්න දෙවියෙකි' යන්නෙන් එය වඩාත් තහවුරු වේ. කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය තුළ සඳහන් වන්නේ 'යුක්තිය වූ කලී බලය ය' යන පටු පරමාර්ථය යි. යුද්ධය, දේශපාලන බලය හා නීතිය උපයෝගී කරගත යුත්තේ රජුගේ බලය රැකගැනීමට හා තහවුරු කරගැනීම සඳහා යන ආත්මාර්ථකාමී දේශපාලන න්‍යාය කෞටිල්‍ය ඉදිරිපත් කරයි. බෞද්ධ දේශපාලන දර්ශනය මීට හාත්පසින්ම වෙනස් වූවකි. සමාජ සම්භවය පිළිබඳව විස්තරයක් ඇතුළත් අග්ගඤ්ඤ සූත්‍රයෙහි පෙන්වා දෙන්නේ රාජ්‍යත්වය දෙවියන් විසින් ඇති කළ දෙයක් නොව සමාජ ගිවිසුමක් මඟින් සමාජයම ඇති කර ගත් දෙයක් බව ය. පොදු දේපල පෞද්ගලීකරණය වීමෙන් සමාජයේ හට ගත් ගැටුම් අවම කර ගැනීමට ජනයාගේ කැමැත්තෙන් පාලකයකු පත් කර ගත් බව එහි සඳහන් වේ. මහ ජනතාවගේ කැමැත්තෙන් හෙවත් සම්මතයෙන් පත් කර ගත් බැවින් 'මහා සම්මත' යන්නෙන් ඔහු ව්‍යවහාර කළේය. එලෙස පත් වූ පාලකයා තම රාජ්‍යයේ සියලුම වැසියන්ගේ සුභ සාධනය සඳහා ක්‍රියා කළ යුතුය. රාජ්‍යයේ ධනය සම සේ බෙදෙන අයුරින් ක්‍රියා කළ යුතුය. ඇති නැති පරතරය දුරලමින් දූෂණය හා සොරකම පිටු දැකිය යුතුය. බෞද්ධ දේශපාලන මූලධර්මයන්ට අනුව රාජ්‍යය විමසන කළ, රජතුමා ජනාදරයට පත්වීම විශේෂ ලක්ෂණයකි. පියෙකු දරුවන්ට ප්‍රියවන්නාසේත්, දරුවන් පියාට ප්‍රියවන්නාසේත් පාලක පාලිත දෙපිරිස ඔවුනොවුන්ට ප්‍රියමනාප විය යුතුය යන්න බුදු දහම පෙන්වා දෙයි. බෞද්ධ දර්ශනය තුළ පාලකයාට කම් සුව විඳීමට කිසිඳු බාධාවක් පනවා නැත. එහෙත් අන් අයගේ සැපයට බාධාවක් වන සේ පාලකයාගේ චර්යාවන් පැවැත්වීමට ඉඩක් ලබා දී නොමැත. පාලකයාගේ චරිත සංවර්ධනය කර ගැනීම

සඳහා අවශ්‍ය මූලධර්ම දස සක්විති ධර්ම තළින් හා අපරිහානී ධර්ම තුළින් බුදු දහම පෙන්වා දෙයි. එමෙන්ම පංචශීල ප්‍රතිපදාව මගින් හා සතර සංග්‍රහ වස්තුව තුළින් සදාචාරාත්මක දේශපාලන දර්ශනයක් බිහි කරගත හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*දීඝ නිකාය III*, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්ත නිකාය I*, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

කලුපහන, ඩී.ජේ, (2005), *මුල් බුදු සමයේ ආචාර විද්‍යාව*, තිවිර ප්‍රකාශකයෝ.

කොතලාවල, ඒ.බී, (2004), *නවීන විද්‍යාව හා මිනිස් ආචාර ධර්ම*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඥානසිරි, පි.ජි, (2004), *ආචාර වාදය*, ආරිය ප්‍රකාශකයෝ.

චන්දිම හිමි, පනාමුරේ, (2011), *බෞද්ධ ආචාර විද්‍යාව*, පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය.

තිලකරත්න, හේ.මු, (1999), *පෙරදිග ආචාර ධර්ම*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රේමසිරි, පි.ඩි, (1998), *ආචාර විද්‍යාව*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රනාන්දු, එස්. දයා, (1984), *බුදු සමයේ දේශපාලන දර්ශනය*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විපුලතිස්ස හිමි, මාහල්ලේ, (2007), *ජාතක සාහිත්‍යය තුළින් පිළිබිඹු වන බෞද්ධ ආචාර ධර්ම*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමරංසි හිමි, උඩගලදෙණියේ, (1987), *බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය*, සමය වර්ධන ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, ධර්මසේන, (2006), *බෞද්ධ සදාචාරය*, දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශනය.